1979 වර්ෂයේ මිළ මට්ටම පිළිබඳව දැකිය හැකි විශේෂ ලක්‍ෂණයක් නම් එය වර්ෂයේ මුල් භාගයේදී සාපේක්‍ෂ වශයෙන් ස්ථායීව පැවත, වර්ෂය අවසානයේදී සීඝ්‍ර වැඩිවීමක් පෙන්නුම් කිරීමය. කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය වර්ෂයේ ප්‍රථම කාර්තු දෙක තුළ සියයට 1 බැගින් වූ වර්ධනයක් පෙන්නුම් කරයි. තුන්වන හා හතරවන කාර්තුවල එහි වර්ධනය පිළිවෙලින් සියයට 4 ක් සහ සියයට 8 ක් විය. මෙයින් පැහැදිලි වන්නේ දර්ශකය වර්ෂය අවසාන භාගයේදී වැඩි වේගයකින් ඉහල ගොස් ඇති බවය. අනෙක් අතට 1979 මුල් භාගයේදී සියයට 5 ක පහත බැසීමක් පෙන්නුම් කළ තොග අලෙවි මිළ දර්ශකය, වර්ෂය අවසානයේ දී එහි මැද භාගයේ මට්ටමට වඩා සියයට 23 කින් වර්ධනය විය.

1979 සැප්තැම්බර් මාසයේදී මිළ සහනාධාර ඉවත් කිරීමත්, අවස්ථා දෙකකදී පිටි මිළ වැඩි කිරීමත්, ඛනිජ තෙල් නිෂ්පාදිත වල මිළ ඉහල යාමත්, යල් කන්නයේ අස්වැන්න සාපේක්‍ෂ වශයෙන් අඩුවීමත්, ජනවාරි හා සැප්තැම්බර් මාසවල වැටුප් වැඩි කිරීමත්, 1978 සියයට 11 ක්වූ මුදල් සැපයුම 1979 දී සියයට 29 දක්වා ඉහල යාමත්, මිළ මට්ටම වැඩි කිරීමට බලපෑවෙය. නමුත් මෙය වෙනත් සාධක මගින් බොහෝ දුරට සමනය විය. එම සාධක අතර නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය යටතේ ආනයනික භාණ්ඩ සැපයුම අධික වීම, භාණ්ඩ ආනයනය හා බෙදා හැරීම කෙරෙහි වූ විශාල තරඟකාරිත්වය සහ වාණිජමය වාහනවල සැපයුම සෑහෙන ලෙස වැඩිවීම නිසා ඇති වූ ප්‍රවාහන පහසුකම් වල වර්ධනය ද ඉතා වැදගත්ය.

සමස්ථයක් වශයෙන් බලන විට 1978 වර්ෂයේදී ආර්ථිකයේ උද්ධමන වේගය අඩුවීමේ ලක්‍ෂණ පෙන්නුම් කළද, 1979 වර්ෂයේ දී එම අපේක්‍ෂාවන් ඉටුනොවී ඇතිබව පෙනේ. දැනට ඇති පිළිගත හැකි දත්ත අනුව, 1978 දී පොදු මිළ මට්ටමේ වර්ධනය වූ සියයට 15 හා සසඳන විට 1979 දී එය සියයට 20 ක ප්‍රමාණයකින් වර්ධනය වී ඇතිබව පෙනේ. මෙම තත්ත්වයට බලපෑ හේතු අතර, වර්ෂය අවසන් භාගයේදී වූ මුදල් සැපයුමේ සීඝ්‍ර වැඩිවීම සහ අනපේක්ෂිත ලෙස විශාල අයවැය හිඟයක් ඇති වීමද වැදගත් වේ. මිළ මට්ටමේ ඇති වූ අධික වැඩිවීමෙන් යටත් පිරිසෙයින් හරි අඩක් සිදු වී ඇත්තේ රජයේ පාලන මිළ ගණන් වල ඇති කරන ලද සංශෝධන හේතු කොට ගෙනය. ඒ අතර මෙම මිළ ගණන් වල සංශෝධන යන් නිසා ජීවන වියදම මත ඇති වූ බලපෑම, වැටුප් වැඩි කිරීම සහ ආහාර මුද්දර ක්‍රමය යටතේ වූ සුභ සාධක ගෙවීම් මගින් අඩුකිරීම සතුටුවිය හැකි දෙයකි.

## මිළ පාලන හා සලාක ක්‍රමය.

1979 දී නිදහස් ආර්ථිකය, භාණ්ඩ ආනයනය හා වෙළඳාම පිළිබඳ දැඩි තරඟකාරිත්වයක ලක්ෂණ පෙන්නුම් කළ අතර, පාරිභෝගික භාණ්ඩ සුලභ කිරීමේ හා මිළ හැසිරවීමේ උපක්‍රම-යක් ලෙස සලාක හා මිළ පාලන ක්‍රම සම්පූර්ණයෙන්ම නොවැදගත් තත්ත්වයට පත්විය. දශක ගණනාවක් තිස්සේ පැවැති අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීමේ සලාක ක්‍රමය, 1979 දී සම්පූර්ණයෙන් ඉවත් කළ අතර, මිළ පාලනය යටතට නව භාණ්ඩ ඇතුළත් කරන ලදී. සලාක ක්‍රමය ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආහාර ද්‍රව්‍යවල මිළ ඉහළයාම අඩුකිරීමේ පියවරක් වශයෙන් රජය මගින් ආදායම් ආධාරක ක්‍රමයක්වූ ආහාර මුද්දර ක්‍රමය ආරම්භ කරන ලදී. ඒ පිළිබඳ වැඩි විස්තර කලින් සඳහන්ව ඇත. 1979 දී තිරිඟු පිටි, පාන්, පරිප්පු සහ සමහර කිරි පිටි හා ළදරු ආහාරවල පාලන මිළ වැඩි කරන ලදී.

1979 තවත් වැදගත් ප්‍රතිපත්ති වෙනස් කිරීමක් වූයේ ජනවාරි මාසයේ පාරිභෝගික ආරක්ෂක පනත සම්මත කිරීමයි. මෙම පනතේ අරමුණ වූයේ අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදාහැරීම ක්‍රමවත් කිරීමයි. මෙම නීතිය මගින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා භාණ්ඩවල මිළ ප්‍රදර්ශනය කිරීම, ලේබල අැලවීම, පැකට් කිරීම, ප්‍රමිත කිරීම, භාණ්ඩ සැඟවීම වැලැක්වීම, උපරිම සිල්ලර මිළ ප්‍රදර්ශනය කිරීම සහ වෙනත් අදාළ කටයුතු සඳහා පියවරවල් ගත හැකි විය. මේ අතර ජාතික මිළ කොමිසම මගින් ඊට ඉදිරිපත් කළ භාණ්ඩවල මිළ විමර්ශනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම කරගෙන යන ලදී. මෙම නිර්දේශ පිළිගැනීමට නිෂ්පාදකයින් හෝ වෙළඳුන් නීතිමය වශයෙන් බැඳී නොසිටි නමුත් ඒවා වෙළඳපොලේ අසාධාරණ මිළ වැඩි කිරීම් පිළිබඳ දැඩි බලපෑමක් ඇති කිරීමට සමත් විය.

## තොග අලෙවි මිල දර්ශකය

1974 = 100

1975 වාර්ෂික; 1976 සිට මාසිකව




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.